# උපාධිධාරීන්ට උපදෙස්
# උපාධි ප්‍රදානෝත්සවය - 2014

## (1) උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වෙන දිනය හා වේලාව

2014 වර්ෂය සඳහා වන උපාධි ප්‍රදානෝත්සවය කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී 2015 සැප්තැම්බර් මස 15 වැනි දින සැසි තුනකින් පැවැත්වීමට නියමිතය.

**පළමුවන සැසිය - පෙරවරු 7.30 ට (පෙළ ගැසීම)**
ඇතුළු වීමේ ටිකට් පත් අංක i සිට vii දක්වා
ඇතුළු වීමේ ටිකට් පත් අංක 1A සිට අංක 910A දක්වා

**දෙවන සැසිය - පෙරවරු 11.30 ට (පෙළ ගැසීම)**
ඇතුළු වීමේ ටිකට් පත් අංක 1B සිට අංක 900B දක්වා.

**තෙවන සැසිය - පස්වරු 3.00 ට (පෙළ ගැසීම)**
ඇතුළු වීමේ ටිකට් පත් අංක 1C සිට අංක 900C දක්වා

## (2) උපාධිලාභීන් / දෙමාපියන් සඳහා උපදෙස් (ඉතා වැදගත්)

ඉඩ පහසුකම් ඉතා සීමිත බැවින් සෑම උපාධිලාභියෙකුටම තමන්ගේ **දෙමාපියන්ගෙන් කෙනෙකු** හෝ **භාරකරුවෙකු** සඳහා **ප්‍රවේශ පත්‍රයක්** නිකුත් කරනු ඇත. මෙම ප්‍රවේශ පත්‍රය ඔබ උපාධි ලෝගුව ලබා ගැනීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය වෙත පැමිණෙන විට ඔබ වෙත නිකුත් කරනු ඇත. ආරක්ෂක හේතූන් මත දෙමාපියන් / අමුත්තන් සඳහා ලබා දෙන ප්‍රවේශ පත්‍ර භාවිතයෙන් උත්සවයට සහභාගීවීමට අවසර ඇත්තේ ඔබ විසින් නම් කරන ලද එක් අයෙකුට පමණි.

## (3) උපාධි ප්‍රදානෝත්සවයේ ඇඳුම්

- උපාධිලාභීන් සිය ජාතික ඇඳුම හෝ යුරෝපීය ඇඳුම (දිග කලිසම, කබාය සහ ටයි පටිය) ඇඳිය යුතුවේ.
- උපාධිලාභිනියන් ඔසරිය / සාරිය / සිය ජාතික ඇඳුම ඇඳිය යුතු වේ.
- **සියළුම උපාධිලාභීන් / උපාධිලාභිනියන් උපාධි ලෝගුව ඇඳිය යුතු වේ.**

## (4) ඡායාරූපගත කිරීම

**උපාධි ප්‍රදානෝත්සව ශාලාව තුළ ඡායාරූප ගැනීම**

උපාධි ප්‍රදානය කරනු ලබන අවස්ථාවේ දී කිසිදු පෞද්ගලික ආයතනයකට හෝ පුද්ගලයෙකුට ශාලාව ඇතුලත ඡායාරූප ගැනීම සපුරා තහනම් වේ. මේ සඳහා නිල වශයෙන් ආයතනයක් පත් කර ඇත. ඔබ උපාධි ලෝගුව ලබා ගැනීමට මෙම ආයතනයට පැමිණෙන විට නිල ඡායාරූප ශිල්පියා සමග අදාළ විස්තර සාකච්ඡා කරගත හැක.

## (5) උපාධි ලෝගු නිකුත් කිරීම.

2015 අගෝස්තු සහ සැප්තැම්බර් මස පහත සඳහන් දිනයන්හි දී පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ දී උපාධි ලෝගු නිකුත් කරනු ලැබේ. ඔබට නියමිත දිනයේ දී හැර වෙනත් දිනයක දී නොපැමිණෙන ලෙස දන්වා සිටිමි. **උපාධි ලෝගුව ලබා ගැනීමට උපාධිලාභියා පැමිණිය යුතු අතර, ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.**

| | | | | | |
|---|---|---|---|---|---|
| විභාග අංක | D 0001 | සිට | D 0562 | දක්වා | 2015-08-25 දින |
| විභාග අංක | D 0563 | සිට | D 1075 | දක්වා | 2015-08-26 දින |
| විභාග අංක | D 1077 | සිට | D 1526 | දක්වා | 2015-08-27 දින |
| විභාග අංක | D 1529 | සිට | D 2133 | දක්වා | 2015-08-28 දින |
| විභාග අංක | D 2134 | සිට | D 2677 | දක්වා | 2015-08-31 දින |
| විභාග අංක | D 2679 | සිට | D 3509 | දක්වා | 2015-09-01 දින |
| විභාග අංක | D 3510 | සිට | D 4229 | දක්වා | 2015-09-02 දින |
| විභාග අංක | D 4230 | සිට | D 4681 | දක්වා | 2015-09-03 දින |
| විභාග අංක | D 4682 | සිට | D 5182 | දක්වා | 2015-09-04 දින |
| විභාග අංක | D 5183 | සිට | D 5762 | දක්වා | 2015-09-05 දින |
| විභාග අංක | D 5765 | සිට | D 6311 | දක්වා | 2015-09-07 දින |
| විභාග අංක | D 6314 | සිට | D 6458 | දක්වා | 2015-09-08 දින |
| ව්‍යාපාර පරිපාලනවේදී සියලුම අපේක්ෂකයින් | | | | | 2015-09-08 දින |

## (6) උපාධි ප්‍රදානෝත්සවයට සහභාගිවීමට නොහැකි වීම

උපාධි ප්‍රදානෝත්සවය සැලසුම් කිරීම සඳහා එයට සහභාගී වන උපාධිලාභීන් හා දෙමාපියන්ගේ නිවැරදි සංඛ්‍යාව දැන ගැනීම ඉතා වැදගත්ය. එබැවින් යම්කිසි කාරණයක් හේතු කොට ගෙන එයට සහභාගිවීමට ඔබට නොහැකි නම්, ඒ බව හැකි ඉක්මණින් අවම වශයෙන් 2015 සැප්තැම්බර් මස 04 වැනි දින පස්වරු 4.00 ට පෙර දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයට දැනුම් දෙන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.

## (7) වැඩිදුර තොරතුරු සහ පැහැදිලි කිරීම්

දුරකථන ක්‍රියාකාරිනි - 081-239 2218

නියෝජ්‍ය ලේඛකාධිකාරි,<br>
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය,<br>
පේරාදෙණිය විශ්ව විද්‍යාලය,<br>
පේරාදෙණිය.<br>
2015-07-16.